පළමුවන කියැවීම නික්මයාම 12:1-8, 11-14

නික්මයාම පොතෙන් ගත් පාඨයකි.

මේ දවස නුඹලාට අනුස්මරණ දිනයක්ද මා හට මංගලෝත්සව දිනයක්ද විය යුතුය.

සමිඳුණන් වහන්සේ මිසර දේශයේ දී මෝසෙස් හා ආරොන්ට කතා කොට මෙසේ වදාළ සේක. මෙම මාසය හැම මාසවලටම මුල් මාසය විය යුතුය. අවුරුද්දේ පළමුවන මාසය විය යුතුය. නුඹලා මුළු ඊශ්‍රායෙල් ජනතාව අමතා, මෙසේ නිවේදනය කළ යුතුය. "මාසයේ දසවන දින හැම මිනිසෙක්ම එක් ගෙදරකට බැටළු පැටවකු බැගින් පවුලකට බැටළු පැටවකු සපයා ගත යුතුය. යම් ගෙදරක වැසියන්ට එක් බැටළු පැටවකු වැඩිනම් ඔවුන් අසල්වැසි ගෙදර අයගේ සංඛ්‍යාව අනුව ඊට හවුල් කර ගත යුතුය. බැටළු පැටවා අනුභව කරන්නන්ගේ ගණන ගිණිය යුත්තේ එක් එක්කෙනා අනුභව කරන ප්‍රමාණය අනුවය. නුඹලා ගන්න බැටළු පැටවා කැළැල් රහිත අවුරුද්දක් වයසැති පිරිමි සතෙකු විය යුතුය. තවද බැටළුවන් හෝ එළුවන් හෝ අකරින් එවැනි එකෙකු තෝරා ගත හැකිය. එම මාසයේදීම දහ හතරවන දින දක්වා තබාගෙන, එදින සවස රැස්වන මුළු ඊශ්‍රායෙල් ජනතාව ඌ මැරිය යුතුය. ඉන්පසු උගේ ලෙයින් ටිකක් රැගෙන බැටළු පැටවා අනුභව කරන අයගේ ගෙදර දොරේ උළුවහු කණු දෙකේ ද උළුවස්සේ උඩ ලීයේද තැවරිය යුතුය. එම රාත්‍රියේදී උගේ මාංශ අනුභව කළ යුතුය. එය අනුභව කළ යුත්තේ, මඳගින්නේ පුළුස්සා, නුමුහුන් රොටි හා තිත්ත පලා සමගය. තවද නුඹ එය අනුභව කළ යුත්තේ මෙසේය. ඉඟපටිය බැඳ, පාවහන් ලා, සැරයටිය ගෙන, එය අනුභව කළ යුතුය. මන්ද, එය සමිඳුණන් වහන්සේ වන මා හට පවත්වන පාස්කුව බැවිනි. එදින රාත්‍රියේ මම මිසර දේශය මැදින් ගොස්, එහි මිනිසුන්ගේ හා මෘගයන්ගේ කුළුඳුලන්ට පහර දෙමි. තවද, මිසරයේ දෙවි දේවතාවුන් සියල්ලන්ට දඬුවම් පමුණුවමි. මම සමිඳුණන් වහන්සේය. නුඹලා සිටින ගෙවල් මත තවරා ඇති ලේ නුඹලා ඒවායේ සිටින සිටින බවට ලකුණක් වන්නේය. මම ලේ දකින විට නුඹලා පසුකර යන්නෙමි. මිසර දේශයට මා පහර දෙන විට ඒ මාරක දඬුවම නුඹලා වෙත නොපැමිණෙනු ඇත. මේ දවස නුඹලාට අනුස්මරණ දිනයක් ලෙස ද සමිඳුණන් වහන්සේ වන මා හට මංගලෝත්සව දිනයක් ලෙස ද පැවැත්විය යුතුය. තවද, මතු සියලු පරම්පරාවලටම එය සදහටම මංගල දිනයක් සේ පැවැත්වීමට නියෝගයක් පැනවිය යුතුය.

දේව වාක්‍යය එසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 116: 12-13, 15-18

පිළිතුර: ආසිරි කුසලානෙන් අපි සමිඳුණන්ගේ රුධිරයට සහභාගි වන්නෙමු.

ගීය: සමිඳුන් මා හට කළ සියලු යහපත්කම ගැන එතුමන්ට මම කුමක් පුදම් ද?
මම ගැළවීමේ කුසලාන ගන්නෙමි. සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි.

සැදැහැවතුන්ගේ මරණය සමිඳුන් අබියස අගනේය. සමිඳුනි, මම ඔබේ
මෙහෙකරුවෙක් වෙමි. සැබැවින්ම ඔබේ මෙහෙකරුවෙක් වෙමි. ඔබේ දාසියගේ
පුත්‍රයා වෙමි. ඔබ මාගේ බැඳුම් මිදූ සේක.

මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි. සමිඳුන්ගේ නාමය අමතා අයදින්නෙමි.
එසේය, සමිඳුන්ගේ මුළු සෙනග ඉදිරියේ මාගේ බාර හාර ඉටු කරන්නෙමි.

දෙවන කියැවීම 1කොරින්ති 11:23-26

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

මේ පූපය වළඳන, මේ කුසලානෙන් පානය කරන සෑමවිටම ඔබ ස්වාමීන් වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහු ය.

මා ඔබට ඉගැන්වූ මේ පිළිවෙත ම ස්වාමීන් වහන්සේ ගෙන්ම ලැබුවෙමි. එනම් ස්වාමීන් වන ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබූ රාත්‍රියේදී පූපයක් රැගෙන ස්තුති කොට කඩා "මෙය ඔබ උදෙසා දෙන මාගේ ශරීරය ය. මා සිහිකිරීම පිණිස මෙය කරන්න" යි වදාළ සේක. එලෙසම රාත්‍රී කෑමෙන් පසු කුසලානයද රැගෙන "මේ කුසලාන මාගේ රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුම ය. යම් පමණ වර ඔබ මෙයින් පානය කරන්නහුද, එපමණ වර මා සිහිකිරීම පිණිස මෙය කරන්න" යි වදාළ සේක. ඔබ යම් පමණ වර මේ පූප අනුභව කරන්නහුද, මේ කුසලානෙන් පානය කරන්නහුද, එපමණ වර ස්වාමීන් වහන්සේ වඩින තුරු ඔබ උන්වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහු ය.

දේව වාක්‍යය එසේ ය.

සාධුකාරය "මම ඔබට අළුත් ආඥාවක් දෙමි. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්නැ"යි ස්වාමීන් වහන්සේ වදාරණ සේක.

ශුද්ධවූ සුවිශේෂය ජුවාම් 13:1-15

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රේමයේ ගැඹුර දක්වන සේක.

තමන් මෙලොවින් ඉකුත්ව පියාණන් වෙතට යාමේ නියමිත මොහොත පැමිණ තිබෙන බව පාස්කු මංගල්‍යයට පෙර, ජේසුස් වහන්සේ දැනගත් සේක. උන්වහන්සේ මෙලොව තම හිතවතුන්ට ප්‍රේම කළ සේක. අන්තිම දක්වාම ඔවුන්ට ප්‍රේම කළ සේක.

රාත්‍රි භෝජනය වළඳන වේලාව පැමිණියේය. යක්ෂයා උන්වහන්සේ පාවා දීමට සීමොන්ගේ පුත් ජුදස් ඉස්කාරියොත්ගේ සිත ඒ වන විටත් පොළඹවා තිබිණි. පියාණන් වහන්සේ තමන් අතට සියල්ල පවරා දී තිබෙන බවද තමන් දෙවියන් වහන්සේ වෙතින් වැඩම කළ බවද තමන් දෙවියන් වහන්සේ වෙතට වැඩම කරන බවද දැන, රාත්‍රි භෝජනයෙන් පසු උන්වහන්සේ නැඟිට තම සළුව ගලවා තබා, තුවායක් ගෙන ඉණ වටා බැඳගත් සේක. ඉන්පසු උන්වහන්සේ භාජනයකට වතුර වත්කොට, ශ්‍රාවකයන්ගේ පාද සෝදන්නටත්, තමන් ඉණ බැඳගෙන සිටි තුවායෙන් පිසදමන්නටත් පටන්ගත් සේක. උන්වහන්සේ සීමොන් පේදුරු ළඟට ආ විට, "ස්වාමීනි, ඔබ වහන්සේ මාගේ පාදත් සෝදන සේක්ද" යි ඔහු ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මා කරන්නේ කුමක්දැයි ඔබ දැන් නොදන්නෙහිය. එහෙත් පසුව ඔබට

වැටහෙනු ඇතැ" යි වදාළ සේක. එවිට පේදුරු, "මා දිවි ඇතිතෙක් කවදාවත් මාගේ පාද සෝදන්නට නම් ඔබ වහන්සේට ඉඩ නොදෙමි" යි කීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මා ඔබ නොසේදුවොත් මා සමඟ සම්බන්ධ කමක් ඔබට නැතැ" යි ඔහුට වදාළ සේක. එවිට සීමොන් පේදුරු, "ස්වාමීනි, මාගේ පාද පමණක් නොව අත් ද හිස ද සේදුව මැනවැ" යි කීය. ජේසුස් වහන්සේද, "ස්නානය කළ තැනැත්තේ මුළුමනින්ම පවිත්‍රය. පාද සේදීම හැර ඔහු තවත් සෝදනු ලබන්නට වුවමනා නැත. ඔබද පවිත්‍රය. එහෙත් හැම කෙනෙක්ම එසේ නොවෙති" යි වදාළ සේක. "හැම කෙනෙක්ම පවිත්‍ර නොවෙති" යි උන්වහන්සේ වදාළේ, තමන් පාවා දෙන්නා කවරෙක්දැයි දැන සිටි බැවිනි. මෙසේ උන්වහන්සේ ඔවුන්ගේ පාද සෝදා, තමන් උතුරු සළුව හැඳගෙන නැවත හිඳගත් කල, ඔවුන්ට මෙසේ වදාළ සේක. "මා ඔබට කළ දේ කිමෙක්දැ යි ඔබ දන්නහුද ? 'ගුරුදේවයෙනි', 'ස්වාමීනි' කියා ඔබ මා අමතන්නහුය. එසේ කීම හරිය. මම එසේම වෙමි. ඔබේ ස්වාමීන් ද ගුරුදේවයන් ද වන මම ඔබේ පාද සේදුවෙම් නම්, ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතුය. මා ඔබට කළාක් මෙන්, ඔබත් කළ යුතු බවට ආදර්ශයක් මම දුනිමි.

සුවිශේෂ වාක්‍යය එසේ ය.